# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2463/26 - 2025 නොවැම්බර් මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2025.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ**
**දොම්පෙ ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන දොම්පෙ ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවේ අංක 03 මිල්ලතේ කොට්ඨාසයට තේරී පත්වූ රාමනායක පතිරන්නැහැලාගේ දිනේෂා මධුෂානි රාමනායක අයත් වන්නා වූ ජාතික ජනබලවේගය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම දොම්පෙ ප්‍රාදේශීය සභාවේ අංක 03 මිල්ලතේ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා කංකානම්ලාගේ බුද්ධිකා වමාලි දිල්රුක්ෂි ධර්මරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

දොම්පෙ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි ඩබ්. ඒ. රවීන්ද්‍ර වික්‍රමසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් කංකානම්ලාගේ බුද්ධිකා වමාලි දිල්රුක්ෂි ධර්මරත්න දොම්පෙ ප්‍රාදේශීය සභාවේ අංක 03 මිල්ලතේ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ඩබ්. ඒ. රවීන්ද්‍ර වික්‍රමසිංහ,**
තේරීම්භාර නිලධාරි,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 18 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

EOG 11 - 0149

1A - PG 7360 — 09 (2025/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*